**ජාතික යෞවුන් සේනාංකය- 2022**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික යෞවුන් සේනාංකය 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික යෞවුන් සේනාංකය මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සේනාංකය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සේනාංකය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සේනාංකයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සේනාංකයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සේනාංකයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සේනාංකයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සේනාංකයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සේනාංකයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සේනාංකයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර භාවිතයේ පැවති රු. මිලියන333 ක් වූ වත්කම් අයිතම 05 ක ඵලදායි ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්වලට ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | සංගීත උපකරණ හා මෝටර් රථ වාහන නැවත අගය කිරීම සිදු කර 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල අදාල ගැලපුම් සිදු කර ඇත. ඉදිරි වර්ෂයේදී අනෙකුත් අයිතමයන්ද නැවත අගය කිරීමට ලක් කර ගැලපුම් සිදු කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් භාවිතයට ගැනීමට සුදුසු වූ දිනයේ සිට ක්ෂය ගණනය කළ යුතු බව දක්වා තිබුණද සේනාංකය විසින් සමාලෝචිත වර්ෂයේදී අත්පත් කර තිබුණු ජංගම නොවන වත්කම් මුළු වර්ෂය සඳහාම ක්ෂය කර තිබීම හේතුවෙන් රු. මිලියන 37 ක් වැඩිපුර ක්ෂය කර තිබුණි. | ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විට එම වත්කම අයත් වන දේපල පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කල යුතු වුවද සේනාංකය විසින් 2022 වර්ෂයේදී මෝටර් රථ ප්‍රත්‍යාගණනයේදී ආයතනය සතු මෝටර් රථ | 2023 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |

| | | |
|---|---|---|
| 03 ක් ප්‍රත්‍යාගණනය නොකර එම වාහන 03 ට අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය වෙන් කිරීම ප්‍රත්‍යාගණන ගිණුමට ගැලපුම් කර තිබුණි. | | |
| (ඇ) 2022 දෙසැම්බර් 31 දින ආයතනයේ වාහන ප්‍රත්‍යාගණනය සිදු කිරීම හේතුවෙන් ඇති වූ ලාභය ගණනය කිරීමේදී 2022 වර්ෂයට අදාල රු. 391,413 ක් වූ ක්ෂය අඩුවෙන් සහ ප්‍රත්‍යාගණිත අගය මත මුළු වර්ෂය සඳහා වාහන ක්ෂය ගණනය කිරීම හේතුවෙන් රු. මිලියන 19 ක් වූ ක්ෂය වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි | 2023 වසර තුල නිවැරදි කිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාලව ක්ෂය වෙන්කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවුරුදු 02 ත් 09 ත් අතර කාල පරාසයක පැවති රු. මිලියන 1.2 ක් වූ රැඳවුම් මුදල් නිරවුල් නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2023 වර්ෂ තුල එම මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු මුදල් අප්‍රමාදව නිරවුල් කල යුතුය. |

**1.6.2 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 අගෝස්තු 21 දින වැඩ අවසන් කර තිබූ වෙන්නප්පුව පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබූ රු. මිලියන 2 ක් සහ අවුරුදු 2 ත් 5 ත් අතර පැරණි රු. මිලියන 120 ක් වූ ලැබිය යුතු කොන්ත්‍රාත් අත්තිකාරම් මෙතෙක් ආපසු අයකර ගෙන නොතිබුණි. | වැඩි පුර ගෙවා ඇති මුදල් එම කොන්ත්‍රාත්කරු වෙත වෙනත් කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් අය වීමට ඇති මුදලින් ලබා දෙන බවට ලිඛිත තහවුරු කිරීමක් සේනාංකය වෙත ලබා දී ඇත. | ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගත යුතුය. |
| (ආ) ඉදිකිරීම් කටයුතු නවතා තිබූ පුහුණු මධ්‍යස්ථාන 5 කට අදාල කොන්ත්‍රාත් ගිවිසුම් වර්ෂ 02 ත් 06 ත් අතර කාලයක සිට අවලංගු කර තිබුණද ඒ සඳහා 2016 – 2017 වර්ෂ වලදී කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබූ එකතුව රු. මිලියන 60.6 ක් වූ අත්තිකාරම් ආපසු අයකරගෙන නොතිබුණි. | පැල්මඩුල්ල පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත් ආයතනය වෙතම දඹුල්ල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදු කරන බැවින් බිල්පත් නිරවුල් කිරීමේදි අත්තිකාරම් මුදල් අයකර ගැනිමට ලිඛිතව එකගතාවය පලකර ඇත.<br><br>කොටපොල පුහුණු මධ්‍යස්ථානයේ අත්තිකාරම් නිරාකරණය සඳහා නීතිපති උපදෙස් පදනම්ව අදාල අත්තිකාරම් මුදල් | නවතා දැමූ ඉදිකිරීම් සඳහා ගෙවන ලද අත්තිකාරම් අය කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.<br><br>වැලිමඩ පුහුණු මධ්‍යස්ථානය හා මීගහකිවුල පුහුණු මධ්‍යස්ථානය සඳහා බේරුම්කරුවෙකු (Arbitration) වෙත ඉදිරිපත් කර නීතිමය කටයුතු සිදුකරගෙන යනු ලබයි.<br><br>ගෝමරන්කඩවල පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නවතා ඇත. | |
| (ඇ) සේනාංකයේ නව මධ්‍යස්ථාන 10 ක හා පවතින මධ්‍යස්ථාන වල ගොඩනැගිලි ඒකක 21 ක් ඉදිකිරීම් කටයුතු විවෘත ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැරව රාජ්‍ය ආයතනයක් මඟින් සිදු කිරීමට 2016 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මෙම ඉදිකිරීම් වල ප්‍රගතිය දුර්වල වීම හේතුවෙන් 2022 වර්ෂයේදී ගෙන තිබූ අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවලංගු කර තිබුණි. 2016 හා 2017 වර්ෂ වලදී මෙම ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දී තිබුණු රු. මිලියන 109 ක අත්තිකාරම් මුදලින් තවදුරටත් අයවිය යුතු රු. මිලියන 38 ක් වූ අත්තිකාරම් අය කර ගැනීමට සේනාංකය අපොහොසත් වී තිබුණි. | තව දුරටත් නිරවුල් කළ යුතු රු. 37,615,680 ක අත්තිකාරම් මුදල අවසන් බිල්පත් නිරවුල් කිරීමේදී අය කර ගැනීමට කටයුතු කරනු ඇත. | නවතා දැමූ ඉදිකිරීම් සඳහා ගෙවන ලද අත්තිකාරම් අය කර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය. | සේනාංකය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 – 2027 වර්ෂයට අදාල කෙටුම්පත් කල උපාය මාර්ගික සැලැස්ම 2023 ජුලි මස 30 වන දින වන විට නිම කිරීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රජ්‍ය ගිණුම් චක්‍රලේඛය | සේනාංකය විසින් 2022 දෙසැම්බර් 31දිනට පිරිවැය රු. මිලියන3,055 ක් වූ දේපල පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගොස් තිබුණද | වර්තමානයේදී වත්කම් නැවත අගය කරමින් වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීම කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිසි පරිදි යාවත්කාලීන කර තිබුණි. | | |
| (ඇ) 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනතේ 2(4) වගන්තිය. | සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෘත්තීය පුහුණුව ,යොවුන් සංවර්ධනය සඳහා කමිටු 3 ක් පත් කරනු ලැබිය යුතු වන අතර සභාව විසින් ස්වකීය බලතල ඒ කමිටු වලට පවරනු ලැබිය හැකි බව සඳහන් කර තිබුණද ජාතික යොවුන් සේනාංකය ආරම්භ කළ 2002වර්ෂයේ සිට එපරිදි කටයුතු කර නොතිබුණි. | සංශෝධනය සඳහා නියමිත නව අධිකාරී පනත තුළ මෙම කමිටු තුන පිළිබඳ සඳහනක් නොමැති බැවින් ඉදිරියේදී පැවැත්වීමට නියමිත සභා රැස්වීම වෙත මෙම කමිටු 03 පත් කිරීම සම්බන්ධයෙන් වූ සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු කර ඇත. | යොවුන් සේනාංක පනත පරිදි කටයුතු කල යුතුය. |
| (ඈ) 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008/(1) දරන චක්‍රලේඛය මගින් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකණ අමාත්‍යාංශ චක්‍රලේඛය. | (i) පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තියට අනුකූලව ආයතනය විසින් පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තිය පිළියෙල කර එය ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>(ii) සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | මේ වන විට කෙටුම්පත් කල පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සංශෝධන කිරීමෙන් අනතුරුව ජාතික යොවුන් සේනාංක සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.<br><br>වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කරමින් පවතින අතර, ඉතා කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය.<br><br>චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) 2017 දෙසැම්බර් 21 දිනැති 02/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ අංක 02 ඡේදය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර සේනාංකය විසින් භාවිතයට ගනු ලබන රු . මිලියන 31ක් පිරිවැය වූ වාහන 08ක් සේනාංකය නමින් ලියාපදිංචි කර නොතිබුණි. | ලියාපදිංචි අයිතිය පවරාගැනීමට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචන**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 4.7 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 16.4 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 21.2 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුළු ආදායමේ වැඩිවීමට වඩා මෙහෙයුම් වියදම හා තරුණ සංවර්ධන කාර්යන් හි වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දින වන විට පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කර තිබූ සේනාංකයට අයත් ඉඩම් 65 ක් අතරින් ඉඩම් 22 ක් පමණක් සේනාංකය වෙත පවරාගෙන තිබුණු අතර ඉතිරි ඉඩම් 43 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මධ්‍යස්ථාන 02 ක ඉඩම් පවරාදීම ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කර ඇත. මධ්‍යස්ථාන 07 ක් පිහිටි ඉඩම් පවරාදීම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ඉතිරි මධ්‍යස්ථාන 31 ක පිහිටි ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු අප්‍රමාදව සිදු කල යුතුය. |
| (ආ) 2011 දෙසැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී වසර 12 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර රටේ තරුණ ප්‍රජාව බල ගැන්වීමේ කාර්යය වඩාත් හොඳින් හා ඵලදායිව ඉටු කිරීම සඳහා එයට ගැලපෙන පරිදි පවතින යොවුන් සේනාංක පනත පරිච්ඡින්න කර නව පනතක් සම්මත කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | මේ සඳහා නීතිපති අනුමැතිය ලබා ගෙන අමාත්‍ය මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කල පසු අමාත්‍ය මණ්ඩලය විසින් දැනුවත් කර ඇත්තේ මෙම පනත සඳහා තවත් සංශෝධන ඇතුලත් කිරීමට ඇති බැවින්, අනුමත කිරීම කල් තබා ඇත. | සේනාංකයේ අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය සංශෝධන සිදුකර පනත අප්‍රමාදව අනුමත ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිපුණතාවය පදනම්ව තරුණ තරුණියන් රැකියා සඳහා යොමු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ශ්‍රම වෙළඳපොල සිටින පිරිස් සඳහා න්‍යායික දැනුම හා පුහුණුව ලබා දීම වෙනුවෙන් 2022 වර්ෂයේ දී සේනාංකය වෙත රු. මිලියන 90 ක අමතර ප්‍රතිපාදනයක් ලබා දී තිබුණි. ඒ සඳහා ආයතනය පුහුණුලාභීන් 4,499 ක් සඳහා පාඨමාලා 16 කින් සමන්විත වූ රැකියාභිමුඛ පුහුණු වැඩ පිළිවෙලක් පෞද්ගලික වෘත්තීය පුහුණු ආයතන 07 ක් සමග ක්‍රියාත්මක කිරීම සඳහා සැලැසුම් සකස් කර තිබුණි. නමුත් ඉහත රැකියාභිමුඛ පුහුණු පාඨමාලා වලින් පාඨමාලා 2 ක් දැනටමත් ආයතනයේ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන පාඨමාලා වුවත් එම පාඨමාලා දෙක සඳහාද ඉහත අරමුදල් වලින් රු. මිලියන 25.8 ක් උපයෝජනය කර තිබුණි. එමෙන්ම ඉහත අරමුදල් වලින් රු.මිලියන 1.6 ක් වැයකර පුහුණුලාභීන් 1,392 ක් සඳහා මාර්ගගත පුහුණු පාඨමාලාවක් පවත්වා තිබුණද අදාල පුහුණුලාභීන්ගේ ප්‍රගතිය පිළිබද දත්ත ආයතනය සතුව නොතිබුණි. තවද ආයතනය සතුව ප්‍රතිපෝෂක දත්ත (Feedback) පැවතියේ පුහුණුලාභීන් 723 කගේ පමණි. මෙයින් මේ වන විට වෘත්තීය පුහුණු සුදුසුකම් (NVQ) සහතික නිකුත් කර තිබුණේ පුහුණුලාභීන් 712 ක් සඳහා පමණි. මේ අනුව සමාලෝචිත වර්ෂය තුල නිපුණතාව පදනම්ව නව රැකියාවක් ලබා දීමේ අරමුණින් සිදුකරනු ලැබූ පුහුණු කිරීමේ කටයුතු වලින් ප්‍රමාණවත් කාර්යසාධනයක් අත්පත් කරගෙන නොතිබුණි.. | තොරතුරු තාක්ෂණ පාඨමාලාව සඳහා පාඨමාලාවේ ගාස්තු මාසයක් වන විටත් ගෙවීමට නොහැකිව ආයතනික වශයෙන් අපහසුතාවයකට පත් ව තිබූ අවස්ථාවක පුහුණුලාභීන්ගේ යහපත උදෙසා පාඨමාලාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණින්, ගෙවිය යුතුව තිබූ රු.15,262,500 ක් මෙම ප්‍රතිපාදන මගින් වැය කරන ලදී.<br>සාමාන්‍ය ක්‍රියාකාරකමක් වූ හෝටල් පුහුණු පාඨමාලාව වෙනුවෙන් ඉල්ලුම් කර තිබූ ප්‍රතිපාදන නිසි කාල සීමාවේදී නොලැබීම හේතුවෙන් රැකියා අභිමුඛ පාඨමාලාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණින් හෝටල් පාඨමාලාව සඳහා අවශ්‍යව තිබූ රු. 8,540,000 ක මුදල මෙම අතුරු අයවැය හරහා වෙන්වූ ප්‍රතිපාදන මගින් වැය දරන ලදී. | අමතර ප්‍රතිපාදන අදාල කාර්යය සඳහාම යෙදවිය යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේනාංකයේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 950 ක් සහ තත්‍ය කාර්ය මණ්ඩලය 743 වූයෙන් නිලධාරීන් 207 ක ගේ පුරප්පාඩු පැවතුණි.එම පුරප්පාඩු තනතුරු වල ඇතුලත් සේනාංකයේ අපේක්ෂිත අරමුණු සහ කාර්ය සාධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපානු ලබන උපදේශක තනතුරු පුරප්පාඩු 117 ක් පැවතුණි. | ජාතික අයවැය චක්‍රලේඛයට අනුව මුදල් අමාත්‍යාංශය මඟින් නව බඳවා ගැනීම තාවකාලිකව නවතා ඇති පසුබිමක මෙම පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත. | පුරප්පාඩු අප්‍රමාදව සම්පූර්ණ කල යුතුය. |